**ජාතික සමාජ සංවර්ධන ආයතනය - 2021**
-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | ----------- |
| (අ) | 2021 පෙබරවාරි සිට 2021 නොවැම්බර් දක්වා කාලය තුළදී බැංකු ජංගම ගිණුම් 02කට ලැබී තිබුණු එකතුව රු.3,187,360 ක්වූ සාමාලෝචිත වර්ෂයට අදාළ පාඨමාලා ගාස්තු ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි. | රු. 3,103,752/- ක්වූ පාඨමාලා ගාස්තු ලැබීම් හඳුනාගෙන 2022 ජූලි සහ ඊට පෙර මාස වලදී ගිණුම් ගත කර ඇතිබව හා. ඉදිරියේදී තැන්පතු හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට අභ්‍යන්තර ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන බව. | ගිණුම් කාල පරිච්ඡේදයට අදාළ පාඨමාලා ගාස්තු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පාඨමාලා හැරගිය ශිෂ්‍යයන්ගේ පාඨමාලා ගාස්තු ගැලපීමට නිශ්චිත ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වනවිට පාඨමාලා හැරගිය ශිෂ්‍යයන්ගේ හිඟහිටි පාඨමාලා ගාස්තු රු.8,117,626 ක් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පාඨමාලා හැරගිය සිසුන්ගෙන් ලැබිය යුතු රු.8,117,626 ක් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | අයකරගත නොහැකි පාඨමාලා ගාස්තු ආදායම් විධිමත් ලෙස කපාහැරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශිෂ්‍යත්ව ප්‍රදාන ලබාදීම සඳහා පෞද්ගලික පාර්ශවයන් විසින් සිදුකළ රු.453,417 ක් වූ ප්‍රදානයන් තුලින් ඉකුත් වර්ෂ 05කට පෙර කාලයේදී ආරම්භකර තිබුණු අරමුදල් 07ක ගිණුම් ශේෂ හිමිකම් යටතේ දක්වනු වෙනුවට ජංගම නොවන වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | ජංගම නොවන වගකීම් යටතේ දැක්වෙන මෙම ප්‍රදාන සමුච්චිත අරමුදලට බැර කර නිවරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රදාන හා පරිත්‍යාග ආපසු ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති නිසා හිමිකම් යටතේ හඳුනාගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------------- | ----------- |
| 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අයකරගත යුතු බව ගිණුම්වල දැක්වුණු රු.16,495,679 ක් වූ පාඨමාලා ගාස්තු අතුරින් රු.8,378,054 ක පාඨමාලා ගාස්තු 2021 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | රු. 8,378,054 ක මුදල ශාස්ත්‍රපති (MSW) උපාධි සඳහා (2018/20) ලැබිය යුතු මුදල් වේ. එම මුදල 2022 වර්ෂයේදී හා ඉදිරි වර්ෂ වලදී ලැබීමට නියමිතය. | හිග පාඨමාලා ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව |

**1.7 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 (ඇ) | කල්ඉකුත් වූ චෙක්පත් අවලංගු කර ගෙවීමට ඇති මුදලක් ලෙස ගිණුම්ගත කිරිම කළ යුතුව තිබුණ ද, ජංගම ගිණුම් 02කට අදාලව එකතු වටිනාකම රු.154,702ක් වූ චෙක්පත් 38ක වලංගු කාලය මාස 06ක් කල් ඉකුත් වී තිබුණ ද එසේ කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සියලුම කල් ඉකුත් වූ චෙක් පත් 2022 සැප්තැම්බර් මාසයේදී ආදායමට ගන්නා ලදී. ඉදිරියේදී ද මාස 06ක් කල් ඉතුත් වූ චෙක් පත් ආදායමට ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කල්ඉකුත් වූ චෙක්පත් ගෙවීමට ඇති මුදලක් ලෙස ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතනය පනතේ 4(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ක්ෂණික වියදම් සඳහා අවශ්‍ය නොවන මුදල් බැංකු ස්ථිර තැන්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. එසේ වුවද 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුම් දෙකෙහි රඳවාගෙන තිබුණු පිළිවෙලින් රු.15,976,657 ක්, රු.14,887,523 ක්, රු.26,079,372 ක්, රු.35,291,816 ක්, රු.45,466,608 ක් හා රු.46,263,732 ක් වූ අතිරික්ත මුදල් සුරකුම්පත්වල හෝ වෙනත් සුදුසු ආයෝජන මාර්ගයක ආයෝජනය කර, ආයතනයේ මූල්‍ය තත්ත්වය වර්ධනය කරගැනිමට කටයුතු කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 30 වන දින මිලියන 25 ක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කළ බව, 2022 අගෝස්තු මාසයේදී නිතර භාවිතා නොවන මුදල් (idle cash) ගණනය කර ස්ථාවර තැන්පතු ආරම්භ කිරීමට පාලක සභාවෙන් අනුමැතිය ලබා ගෙන ඇති බව. | ජාතික සමාජ සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.14,190,332 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.13,141,022 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,049,310 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන රු.10,548,228 කින් සහ දීමනා ගෙවීම්, පරිපාලන හා වැඩසටහන් වියදම් රු.9,409,162 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.